NLDB

# කෘෂිකර්ම අමාත්‍යාංශය

## ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය
## (NLDB)

# පුරප්පාඩු

පහත සඳහන් තනතුර සඳහා යෝග්‍යතා පූර්ණ හා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකීය පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**තනතුර** : **පශු වෛද්‍ය MM 1-1-2016**

**සුදුසුකම්** : පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් පශු වෛද්‍ය විද්‍යාව පිළිබඳ උපාධියක් (BVSc) සහ ශ්‍රී ලංකා පශු වෛද්‍ය සභාවේ (SLVC) ලියාපදිංචිය

**වයස** : අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප** : MM 1-1-2016 : රු. 53,175/- -10x1,375/- - 15x1, 910/- - 95,575/-

**වෙනත් දීමනා** : ජීවන වියදම් දීමනාව රු. 7,800/-

පශු වෛද්‍යවරුන් සඳහා අයවැය දීමනාව – රු. 7,500/-

ඉහත වැටුපට හා දීමනාවන්ට අමතරව මණ්ඩලය විසින් අනුමත කර ඇති දීමනාවන් සහ ප්‍රතිලාභ ගෙවනු ලැබේ.

**සෑම අයදුම්කරුවෙකුම :**

(i) ශ්‍රී ලාංකීය පුරවැසියෙකු විය යුතුය.

(ii) දිවයිනේ ඕනෑම පළාතක සේවය කිරීමට හැකිවන සේ සහ තනතුරට අදාළ රාජකාරී කටයුතු මනාව ඉටුකළ හැකි වන සේ උචිත කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(iii) විශිෂ්ට හා අනර්ඝ චරිතයකින් යුක්ත විය යුතුය.

(iv) ඉංග්‍රීසි භාෂාවෙන් වැඩ කටයුතු කිරීමට හැකියාව හා දැනුම අමතර වාසියක් වනු ඇත.

අයදුම්කරුවන්, තමන් විසින්ම පිළියෙල කරගත් අයුම්පත් සිය සම්පූර්ණ ජීව දත්ත තොරතුරු හා ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් ලිපින හා දුරකථන අංකද සමග අදාළ සහතිකවල පිටපත් ද ඇතුළුව 2022 ජූනි මස 21 වන දිනට හෝ ඊට පෙර ලැබෙනසේ කොළඹ 05, නාරාහේන්පිට නාවල පාරේ අංක 40 හි ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ සභාපති වෙත ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. කරුණාකර අයදුම්කරන තනතුර පැහැදිලිව සටහන් කරනු මැනවි.

රජයේ ආයතනවල දැනටමත් සේවයේ නියුතු අයදුම්කරුවන් සිය අයදුම්පත් අදාළ ආයතනවල ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

**සභාපති,**
**ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය,**
**අංක 40, නාවල පාර,**
**නාරාහේන්පිට, කොළඹ 05.**